" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொது தொலைபேசி / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/05 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2019.11. 11 |
|---|---|---|---|---|---|

<u>පාලන චක්‍රලේඛ 10/2019</u>

ආණ්ඩුකාර ලේකම් (බ.ප.)
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)
ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම් කාර්යාලය
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් (බ.ප.)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු)
අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන/ පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරි

<u>ගොඩනැගිලි තුළ සිදුකරනු ලබන නඩත්තු හෝ සේවා කටයුතු වලදී ආරක්ෂක ඇඳුම් හා උපකරණ භාවිතා කිරීම.</u>

බස්නාහිර පළාත් සභාවේ ආයතන ස්ථාපිත කර ඇති ගොඩනැගිලි තුළ හා ඒ අවට ප්‍රදේශයේ සිදුකරනු ලබන නඩත්තු හා සේවා කටයුතුවලදී ඒ සඳහා සහභාගිවන නිලධාරීන් නියමිත ආරක්ෂක ඇඳුම් හා උපකරණ (හිස් වැසුම්, සපත්තු ආදී) භාවිතා නොකරන බැවින් එවැනි නඩත්තු හෝ සේවා කටයුත්තකදී ආරක්ෂක උපකරණ භාවිතා කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කරන ලෙස සියලුම ආයතන ප්‍රධානීන් වෙත දැන්වීමට 2019.10.22 දින පැවති කළමනාකරණ කමිටු රැස්වීමේදී තීරණය විය.

02. හදිසි හා අත්‍යාවශ්‍ය අවස්ථාවකදී කඩිනමින් ක්‍රියාකළ යුතු අතරම නිලධාරීන් තම ආරක්ෂාව සලසා ගැනීම ද අත්‍යාවශ්‍ය කරුණක් වන බැවින් තම ආයතනය තුළ හා ඒ අවට සිදුවන නඩත්තු හෝ සේවා කටයුතු සිදුකිරීමට ඔබ ආයතනය මඟින් යොදවන නිලධාරීන් හා එවැනි කටයුත්තක් සඳහා බාහිරින් පැමිණෙන නිලධාරීන් ආරක්ෂක ඇඳුම් හා උපකරණ පැළඳ සිටින්නේ ද යන්න පිළිබඳව විමසිලිමත්ව කටයුතු කරන ලෙස දන්වමි.

03. තවද, ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලබන වැඩබිම් තුළ සේවය කරනු ලබන නිලධාරීන් හා සේවක මහතුන් ද ආරක්ෂාව සඳහා පැළඳිය යුතු සියලුම ආරක්ෂක ඇඳුම් හා උපකරණ පැළඳීම අනිවාර්යය බවත් වැඩබිමෙහි කටයුතු නිරීක්ෂණය කරන ප්‍රධානියා විසින් මේ පිළිබඳව අවධානය යොමුකල යුතු බවත් අවධාරණය කරමි.

04. මේ පිළිබඳ ඔබ යටතේ ඇති සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.
0/c